" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொது தொலைபேசி / General Telephone - 011 - 2093000

SLSI ISO 9001
SLAB ACCREDITED
ISO/IEC: 17021
QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/01-2023 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. දිනය / திகதி / Date 2023.08.09

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),

ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),

සභා ලේකම් (බ.ප.),

ලේකම්, (පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),

පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),

ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),

අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),

ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්,

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2023.07.20 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2023.05.29 රා.ප.චක්‍රලේඛ 10/2015(V) | ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම - නිදහස් කිරීම. |

02. මෙම චක්‍රලේඛවල පිටපතක් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.එම්.එච්.කුසුම්සිරි,
පරිපාලන නිලධාරී (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල් / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதம உள்ளகக் கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606 Fax : 0112092609 dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631 Fax : 0112092647 dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640 Fax : 0112092636 dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532 Fax : 0112092533 dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501 Fax : 0112092505 dcs@eng.wpc.gov.lk | Tel : 0112092628 Fax : 0112092625 cia@cs.wpc.gov.lk |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 10/2015 (V)

මගේ අංකය : CS/SLAS/AMEN/MINU(V) වෙළුම

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

නිදහස් චතුරශ්‍රය

කොළඹ 07.

2023.05.29

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

දිස්ත්‍රික් ලේකම්වරුන්

ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම - නිදහස් කිරීම්</u>**

ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ 2015.04.23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 10/2015 හි 03 ඡේදයෙහි අනු අංක : IV යටතේ පහත වගන්තිය ඇතුලත් කරනු ලැබේ.

IV. පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය යටතේ සඳහන් "කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය" යන විෂය සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක, තොරතුරු තාක්ෂණය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂය උපාධියේ ප්‍රධාන විෂයක් ලෙස හදාරා උපාධියක් ලබා තිබීම හෝ එම විෂයන්ට අදාළව විද්‍යාවේදී උපාධියක් හෝ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය ඇතිව වේ.



කේ.ඩී.එන්. රංජිත් අසෝක

ලේකම්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-698605

ෆැක්ස් : 0112-683651

විද්‍යුත් ලිපිනය : pubad.dslas@gmail.com